# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2026 ඔක්තෝබර් මස 09 වන දින

## II වන කොටස

## අතිරේකය

(2026.10.14 දින නිකුත් කරන ලදී)

**භාර (සංශෝධන)**

**(87 වන අධිකාරය වූ) භාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 101.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** **:** මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ අධිකරණ බලය මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ලබා දීම හේතුවෙන් "අධිකරණය" සඳහා වන අර්ථ නිරූපණය ඉවත් කිරීම වේ.

***3 වන වගන්තිය*** **:** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 5අ වන වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර, ඇතුළත් කරන, ලද අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති යටතේ ඇති කරනු ලබන භාරවල සාධන පත්‍ර ලියාපදිංචි කිරීමේ කාර්යපටිපාටියක් සඳහා විධිවිධාන සැලසීම;

(ආ) විදේශ රටක නීතියක් යටතේ ඇති කරන ලද භාර ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැලසීම;

(ඇ) විවිධ අවස්ථාවන්හි දී භාරයක් ක්‍රියාත්මක වන දිනය පැහැදිලි කිරීම; සහ

(ඈ) පවත්නා භාර ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැලසීම,

වේ.

***4 වන වගන්තිය*** **:** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ භාරයකට අදාළ තොරතුරු සම්බන්ධයෙන් වන පවත්නා විධිවිධාන වැඩිදියුණු කිරීම වේ.

***5 වන වගන්තිය*** **:** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6ආ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් භාර පිළිබඳ තොරතුරු සැපයීම සම්බන්ධයෙන් වන පවත්නා විධිවිධාන වැඩිදියුණු කිරීම වේ.

***6 වන වගන්තිය*** **:** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19අ වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජිත පරිදි වූ අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ අර්ථලාභීන් පිළිබඳ තොරතුරු ද ඇතුළත්ව ප්‍රකාශිත භාරයක් පිළිබඳ තොරතුරු පවත්වාගෙන යාමේ කාර්ය එකී භාරයේ භාරකරු වෙත පැවරීම වේ.

***7 වන වගන්තිය*** **:** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19ආ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ භාරයක් පිළිබඳ තොරතුරු අදාළ අධිකාරීන් වෙත සැපයීමේ බලය පවරන ලද තැනැත්තකුට බලය ලබා දීම වේ.

***8 වන වගන්තිය*** **:** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19අ වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජිත අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ 5අ වන, 6අ වන, 19 වන, 19අ වන සහ 19ආ වන වගන්තිවල විධිවිධාන උල්ලංඝනය කිරීමක දී දණ්ඩන පැනවීම වේ.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 19ඈ වන සහ 19ඉ වන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, අලුත් වගන්තිවල නීතිය බලපෑම වනුයේ -

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පරිපාලන දඩ මුදල් පැනවීම සඳහා විධිවිධාන සැලසීම; සහ

(ආ) එම දඩ මුදල් අයකර ගැනීම සඳහා වන කාර්යපටිපාටිය සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම,

වේ.

එල්.ඞී.- ඕ. 1/2025

## (87 වන අධිකාරය වූ) භාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක        දරන භාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

87 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** 2018 අංක 6 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත, (මේ පනතේ ‘‘ප්‍රධාන ප්‍රඥප්තිය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (ග) ඡේදය ඉවත් කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ ‘‘ප්‍රකාශිත භාර’’ යන අර්ථ නිරූපණයේ ‘‘සාමාන්‍යයෙන් ලිඛිත වූ සාධන පත්‍රයක්’’ යන වචන වෙනුවට ‘‘ලිඛිත වූ සාධන පත්‍රයක්’’ යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 5අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 5අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

‘‘භාරයේ සාධන පත්‍රය ලියාපදිංචි කිරීම

**5අ.** (1) 5 වන වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්තිය යටතේ ඇති කරනු ලබන භාරයක භාරකරුවෙකු විසින්, ඒ භාරය ඇති කරමින් සාධන පත්‍රය ලියා අත්සන් කරනු ලබන දින සිට මාසයක් ඇතුළත, ඒ භාරයේ සාධන පත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

PL 15966 - 465 (2026/10)

(2) (අ) නිශ්චල දේපළකට අදාළ භාරයක් අන්තිම කැමති පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන අවස්ථාවක දී, ඒ නිශ්චල දේපළ විකුණමින් හෝ පවරමින් ඒ අන්තිම කැමති පත්‍රය අනුව ඉන් පසුව ලියා අත්සන් කරනු ලබන යම් සාධන පත්‍රයක්, එම විකිණීම හෝ පැවරීම සිදු කළ දින සිට මාසයක කාලයක් ඇතුළත රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(ආ) චංචල දේපළකට අදාළ භාරයක් අන්තිම කැමති පත්‍රයක් මගින් ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක දී, ඒ අන්තිම කැමති පත්‍රය සමග ප්‍රොබේට් බලපත්‍රය, ඒ ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කරනු ලබන දින සිට මාසයක කාලයක් ඇතුළත රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(3) (අ) විදේශ රටක නීතිය යටතේ ඇති කරනු ලබන සහ එමගින් පාලනය කරනු ලබන භාරයක භාරකරුවකු හෝ (මේ ආඥාපනතේ "බලයලත් තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන) භාරකරු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින්, ශ්‍රී ලංකාව තුළ භාරය ක්‍රියාත්මක වන දින සිට මාස තුනක කාලයක් ඇතුළත, ඒ භාරයේ සාධන පත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(ආ) මේ උපවගන්තියේ කාර්ය සඳහා, ශ්‍රී ලංකාව තුළ භාරය ක්‍රියාත්මක වන දිනය යන්නට-

(i) ශ්‍රී ලංකාවේ යම් මූල්‍ය ආයතනයක ගිණුමක් විවෘත කරනු ලබන දිනය;

(ii) ශ්‍රී ලංකාවේ ආයෝජනයක් සිදු කරනු ලබන දිනය;

(iii) ශ්‍රී ලංකාවේ දී අර්ථලාභී අයිතිය සඳහා ගෙවීමක් සිදු කරනු ලබන දිනය;

(iv) ශ්‍රී ලංකාව තුළ දී ඒ භාරය සම්බන්ධයෙන් යම් ව්‍යාපාර කටයුත්තක් හෝ යම් වැඩ කටයුත්තක් ආරම්භ කරනු ලබන දිනය;

(v) ඒ භාරයේ භාරකරුවකු හෝ භාර සේවා සපයනු ලබන බලයලත් තැනැත්තකු එකී තැනැත්තා විදේශිකයකු නම්, ශ්‍රී ලංකාවේ පදිංචිකරුවකු වන දින හෝ ස්ථිරව වාසය කිරීම කරනු ලබන දිනය; හෝ

(vi) ඒ භාරයේ භාර සේවා සැපයීම ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරනු ලබන දිනය,

ඇතුළත් වේ.

(4) මේ වගන්තිය බලාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව 5 වන වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්තිය යටතේ ඇති කරනු ලැබූ භාරයක භාරකරුවකු විසින්, මේ වගන්තිය බලාත්මක වීම ආරම්භ වන දින සිට මාස හයක් ඇතුළත, ඒ භාරයේ සාධන පත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(5) භාර සාධන පත්‍රයක් ලියාපදිංචි කිරීම සඳහා වන සෑම ඉල්ලීමක් ම, අවස්ථාවෝචිත පරිදි, භාරයේ සාධන පත්‍රයේ පිටපතක් හෝ (2) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබ ඇති ලේඛන සමග නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, නියම කරනු ලැබිය හැකි

ගාස්තුවක් ඒ සමග ගෙවිය යුතු ය. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, අවශ්‍ය අවස්ථාවල දී, වැඩිදුර තොරතුරු සපයන ලෙස ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

(6) භාරයේ සාධන පත්‍රය ලියාපදිංචි කිරීමෙන් පසුව, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. සෑම ලියාපදිංචි කිරීමේ සහතිකයක් ම නිකුත් කළ දින සිට වසර පහක් සඳහා වලංගු විය යුතු ය.

(7) ලියාපදිංචි කිරීමේ සහතිකයක්, එය කල් ඉකුත් වීමට මාස තුනකට නොඅඩු කාලයකට පෙර දී රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් තත්කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත අලුත් කරනු ලැබිය හැකි විය යුතු අතර නියම කරනු ලැබිය හැකි ගාස්තුවක් ද ඒ සමග ගෙවිය යුතු ය.”.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වන වගන්තිය එහි (2) වන උපවගත්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වන වගන්තිය සංශෝධනය කිරීම

“(2) ප්‍රකාශිත භාරයක් හා සම්බන්ධ යම් නිශ්චල දේපළක හෝ චංචල දේපළක භාරකරු හෝ බලයලත් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, 5අ වන වගන්තියේ (1) වන, (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති කාලසීමා තුළ දී (1) වන උපවගන්තිය යටතේ වන රෙජිස්ටරය සකස් කිරීම සහ පවත්වාගෙන යාමේ කාර්ය සඳහා සියලු තොරතුරු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

(3) භාරකරුවකු හෝ බලයලත් තැනැත්තකු විසින්, 5අ වන වගන්තියේ (4) වන සහ (5) වන උපවගන්තිවල

විධිවිධාන යටතේ භාරයේ සාධන පත්‍රය ලියාපදිංචි කරනු ලබන අවස්ථාවෙහි ඉදිරිපත් කරනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතු වූ තොරතුරුවලට අතිරේකව, නියම කරනු ලැබිය හැකි, භාරයට අදාළ වෙනත් යම් තොරතුරු ලබා දිය යුතු ය.

(4) භාරකරුවෙකු හෝ බලයලත් තැනැත්තකු විසින්, එම තොරතුරුවලට පසුව සිදු කරනු ලබන වෙනස්කම් වාර්තාගත කරනු ලබන දින සිට වැඩ කරන දින දහහතරක් ඇතුළත, (2) වන උපවගන්තිය යටතේ දී ඇති එම තොරතුරුවලට පසුව සිදු කරන ලද වෙනස්කම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු ය.”.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6ආ වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 6ආ වන වගන්තිය සංශෝධනය කිරීම

“(1) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් 6අ වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරයේ සඳහන් යම් ප්‍රකාශිත භාරයකට අදාළ තොරතුරු,

(අ) නීතිපතිවරයා;

(ආ) 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය;

(ඇ) විගණකාධිපති දෙපාර්තමේන්තුව;

(ඈ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඉ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා;

(ඊ) මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හෝ වෙනත්

යම් සාපරාධී වරදක් විමර්ශනය කිරීමේ හෝ ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමේ වගකීම ඇති යම් පොදු අධිකාරියක්;

(උ) රාජ්‍ය ප්‍රසම්පාදන අධිකාරියක්; හෝ

(ඌ) යම් ලිඛිත නීතියක් යටතේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හෝ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම අධීක්ෂණය කිරීමට හෝ නිරීක්ෂණය කිරීමට නියම කරනු ලැබ ඇති යම් නියාමන අධිකාරියක්,

විසින් කරනු ලබන ඉල්ලීමක් මත සැපයිය යුතු ය.

(1අ) (1) වන වගන්තියේ කාර්යය සඳහා, ලබා දෙන තොරතුරුවලට, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් දරනු ලබන තොරතුරුවල ප්‍රමාණය අනුව, පහත තොරතුරු ද ඇතුළත් විය යුතු ය:-

(අ) භාරයක් ඇති කරනු ලැබූ දිනය, භාරයට අදාළ වන නීතිය සහ භාරකරු පදිංචි ස්ථානය ඇතුළත්ව ප්‍රකාශිත භාරයක් පිළිබඳ මූලික තොරතුරු,

(ආ) අර්ථලාභීන් හෝ අර්ථලාභීන් පන්තිය ද ඇතුළුව 19අ වන වගන්තියෙහි සඳහන් තොරතුරු; සහ

(ඇ) යම් ලිඛිත නීතියක් යටතේ වාර්තා කරන ලද යම් ගිණුම්, ආයෝජන හෝ වෙනත් වත්කම්.

(1ආ) 6අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද තොරතුරු,

පරීක්ෂා කිරීම සඳහා මහජනයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඉලෙක්ට්‍රොනික හෝ භෞතිකමය ආකාරයකින් සපයනු ලැබිය යුතු වන නමුත්, එම තොරතුරු, භාරයේ කර්තෘගේ, භාරකරුගේ සහ අර්ථලාභියාගේ සම්පූර්ණ නම්වලට සහ එකී අර්ථලාභියාගේ අර්ථලාභි අයිතියේ ස්වභාවයට සහ ප්‍රමාණයට සීමා විය යුතු ය:

එසේ වුව ද, යම් වැඩිදුර තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරන මහජන සාමාජිකයකු විසින් 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව තොරතුරු සඳහා ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19අ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19අ වන වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:-

“අනන්‍යතාව සම්බන්ධයෙන් වාර්තාවේ ඇති තොරතුරු භාරකරුවා විසින් යාවත්කාලීන කළ යුතු බව

**19අ.** (1) 6 වන වගන්තිය සමග කියවිය යුතු, 5 වන වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ප්‍රකාශිත භාරයක් ඇති කරනු ලබන අවස්ථාවේ දී, පහත දැක්වෙන තැනැත්තන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන්, නියම කරනු ලැබිය හැකි පහත දැක්වෙන සියලු තොරතුරු පිළිබඳව භාරකරු විසින් වාර්තා තබාගනු ලැබිය යුතු ය:-

(අ) භාරකරු හෝ බලයලත් තැනැත්තා පිළිබඳව;

(ආ) සම භාරකරුවකු, සිටී නම්, ඒ තැනැත්තා පිළිබඳව;

(ඇ) භාරයේ කර්තෘ පිළිබඳව;

(ඈ) භාරයේ අර්ථලාභියා පිළිබඳව හෝ අර්ථලාභීන් විසින් නිශ්චිතව නිර්වචනය කරනු ලැබිය හැකි වන හෝ නිශ්චිතව දැක්විය හැකි වන තැනැත්තන් කාණ්ඩයක් ස්ථාපනය කරනු ලබන අවස්ථාවක දී, සාධාරණව දැනගත හැකිතාක් දුරට එකී සෑම අර්ථලාභියකු ම පිළිබඳව හෝ පුද්ගලික අනන්‍යතාවය තහවුරු කිරීම සාධාරණව ප්‍රායෝගික නොවන අවස්ථාවක දී, එම පන්තියට අයත් අර්ථලාභීන් හඳුනා ගැනීමට සාධාරණව ප්‍රායෝගික වන, උපකාර වන තොරතුරු ද සමග අර්ථලාභීන් පන්තියේ නිශ්චිත ලක්ෂණ ද ඇතුළත්ව, අර්ථලාභීන් පන්තිය පිළිබඳ පැහැදිලි විස්තරයක්;

(ඉ) භාරකරුවකු හෝ වෙනත් තුන්වන පාර්ශ්වයක් ද ඇතුළත් වන්නා වූ ද ඊට ම සීමා නොවන වූ ද, භාරය සම්බන්ධයෙන් හෝ භාර දේපළ බෑහැර කිරීම සම්බන්ධයෙන් සඵල පාලනයක් පවත්වාගෙන යා හැකි වෙනත් යම් ස්වභාවික තැනැත්තකු පිළිබඳව; සහ

(ඊ) අනුයෝජිතයකු, නෛතික නියෝජිතවරයකු, කළමනාකරුවකු, ආයෝජන උපදේශකවරයකු, බදු උපදේශකවරයකු, ගණකාධිකාරවරයකු හෝ අන්‍යාකාරයකින් යම් තීරණ ගැනීමේ අධිකාරයක් ඇති හෝ භාරය සම්බන්ධයෙන් තීරණ ගන්නකු වෙනුවට කටයුතු කරන වෙනත් යම් ස්වභාවික තැනැත්තකු පිළිබඳව.

(2) භාරකරුවකු විසින් විශ්වාසනීය සහ ස්වාධීන මූලාශ්‍ර ලේඛන, දත්ත හෝ තොරතුරු යොදා ගනිමින්, හැකිතාක් දුරට, අර්ථලාභීන් පිළිබඳ තොරතුරු හෝ අර්ථලාභීන් පන්තිය පිළිබඳ තොරතුරු ද ඇතුළත්ව (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු, ප්‍රමාණවත්, නිරවද්‍ය සහ යාවත්කාලීන වන බවට තහවුරු කර ගැනීම සඳහා සාධාරණ පියවර ගත යුතු වන අතර, එකී තොරතුරු, යෝග්‍ය කාල පරාසවල දී ප්‍රකාශන භාරයක් ආශ්‍රිත මුදල් විශුද්ධිකරණ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම හෝ මුදල් සැපයීම සංගුණනය කිරීම සම්බන්ධයෙන් වන අවධානම් මට්ටම් කෙරෙහි අවධානය ද යොමු කරමින්, සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම ද කළ යුතු ය.

(3) භාරකරුවකු විසින්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ අර්ථානුකූලව යම් මූල්‍ය ආයතනයක් හෝ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක් හෝ වෘත්තියක් සමග ප්‍රකාශිත භාරයක් වෙනුවෙන් ව්‍යාපාරික සබඳතාවක් ඇති කර ගැනීමේ දී හෝ යම් ගනුදෙනුවක් සිදු කිරීමේ දී -

(අ) ඔහු භාරයක භාරකරුවකුගේ නිල තත්ත්වයෙන් කටයුතු කරන බව එකී ආයතනය, ව්‍යාපාරය හෝ වෘත්තියට හෙළිදරව් කරනු ලැබිය යුතු ය;

(ආ) භාරය 5අ වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම අවශ්‍ය වන්නේ නම් එකී ලියාපදිංචිය අවශ්‍යය ද යන්න එකී ආයතනයට, ව්‍යාපාරයට හෝ වෘත්තීයට, තහවුරු කළ යුතු අතර, එසේ ලියාපදිංචි කිරීම අවශ්‍ය වන්නේ නම් ලියාපදිංචිය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය; සහ

(ඇ) ඉල්ලීමක් කිරීමේ දී යම් ලිඛිත නීතියක් යටතේ ගනුදෙනුකරුවන් කෙරෙහි නිසි සැලකිල්ලට සහ අර්ථලාභී අයිතියට අදාළව ස්වකීය බැඳීම් සමග අනුකූල වීමට ඒ ආයතනයට, ව්‍යාපාරයට හෝ වෘත්තියට හැකි වනු පිණිස ඒ ආයතනයට, ව්‍යාපාරයට හෝ වෘත්තියට අවශ්‍ය වන්නා වූ යම් ලේඛන සමග මේ වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලැබූ තොරතුරු ඒ සඳහා කරනු ලබන ඉල්ලීමක් මත අනිසි ප්‍රමාදයකින් තොරව ලබා දෙනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ සඳහන් කරනු ලබන තොරතුරුවල යම් වෙනසක් වුවහොත්, භාරකරු විසින් අනිසි ප්‍රමාදයකින් තොරව, ප්‍රකාශිත භාරයක් සම්බන්ධව ව්‍යාපාරික සබඳතාවයක් පවත්වාගෙන යනු ලබන යම් මූල්‍ය ආයතනයක් හෝ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක් හෝ වෘත්තියක් දැනුම්වත් කරනු ලබන බවට වගබලාගත යුතු ය.

(5) තැනැත්තන් පන්තියේ අර්ථලාභය පිණිස ප්‍රකාශිත භාරයක් ඇති කර ඇති අවස්ථාවක දී එම පන්තියට අයත් සෑම තැනැත්තකුගේ ම අනන්‍යතාව පිළිබඳ නියම කරනු ලැබිය හැකි එකී සියලු තොරතුරු, හැකිතාක් උපරිම දුරට (1) වන උපවගන්තිය යටතේ වාර්තාගත කර තබනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තන්ගේ අනන්‍යතාව පිළිබඳ තොරතුරු පහත දැක්වෙන ආකාරයෙන් වාර්තාගත කර තබාගත යුතු ය:-

(අ) එකී තැනැත්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන හෝ සමාගම්වලට අදාළ කලින් වූ යම් ලිඛිත නීතියක් යටතේ සංස්ථාගත කළ හෝ ලියාපදිංචි කළ සමාගමක් වන්නේ නම්, එකී සමාගමේ අර්ථලාභී හිමිකරුවන් වන්නා වූ ස්වභාවික තැනැත්තන්ගේ අනන්‍යතාවය පිළිබඳ තොරතුරු;

(ආ) එකී තැනැත්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන හෝ සමාගම්වලට අදාළ කලින් වූ යම් ලිඛිත නීතියක විධිවිධානවලට පරිබාහිර යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද පුද්ගල මණ්ඩලයක් වන්නේ නම්, එකී පුද්ගල මණ්ඩලයේ අර්ථලාභී අයිතියේ හිමිකරුවන් වන්නා වූ ස්වභාවික තැනැත්තන්ගේ අනන්‍යතාව පිළිබඳ තොරතුරු;

(ඇ) එකී තැනැත්තා ව්‍යාපාර ආයතනයක්, හවුල් ව්‍යාපාරයක්, භාරයක් හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක් වන්නේ නම්, එකී ව්‍යාපාර ආයතනයේ, හවුල් ව්‍යාපාරයේ, භාරයේ හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයේ තත් කාලය සඳහා වූ අර්ථලාභී අයිතියේ හිමිකරුවන් වන්නා වූ ස්වභාවික තැනැත්තන්ගේ අනන්‍යතාවය පිළිබඳ තොරතුරු; හෝ

(ඈ) එකී තැනැත්තා (අ), (ආ) හෝ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති යම් කාණ්ඩයක් යටතට අයත් නොවන්නේ නම්, යම් අස්තිත්වයකට හෝ භාරයකට

අදාළව ගනුදෙනුවක් සිදු කරනු ලබන්නේ කවර තැනැත්තකු වෙනුවට ද එම තැනැත්තා පිළිබඳ තොරතුරු.

(7) (6) වන උපවගන්තියේ කාර්ය සඳහා-

"අර්ථලාභී අයිතිකරු" යන්නෙන්, සමාගමේ කොටස් හෝ ඡන්දය දීමේ අයිතිවාසිකම් හෝ වෙනත් හිමිකාරත්ව අයිතිය පිළිබඳ ඍජු හෝ වක්‍ර අයිතිය හෝ පාලනය හරහා, සම්පූර්ණ සමාගමේ ම හෝ එහි කොටසක ඒ සියයට දහයක හෝ ඊට වැඩි කොටසක පරම අයිතිය හෝ පාලනය සතු වන ස්වභාවික තැනැත්තකු අදහස් වන අතර, ඊට අනෙකුත් ක්‍රම මගින් සඵල පාලනයක් පවත්වාගෙන යන්නා වූ ස්වභාවික තැනැත්තකු ද ඇතුළත් වන අතර, ඒ අනුව අර්ථලාභී අයිතිය තේරුම් ගනු ලැබිය යුතු ය;

"සඵල පාලනය" යන්නට, ජාල අයිතියක් හරහා හෝ අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමෙන් හෝ ඉවත් කිරීමෙන් හෝ සමාගමේ මෙහෙයුම්වලට, එහි ව්‍යාපාර පිළිවෙත්වලට හෝ සමාගමේ සාමාන්‍ය පාලනයට බලපෑමක් ඇති කරන්නා වූ ක්‍රමෝපාය තීරණ ගැනීමේ හැකියාව වැනි වක්‍ර ආකාරවලින් අයිතිය පාලනය ක්‍රියාත්මක

කරනු ලබන තත්ත්වයක් ද අයත් වේ;

"සමාගම්වලට අදාළ කලින් වූ ලිඛිත නීතිය" යන්නෙන්, (145 වන අධිකාරය වූ) සමාගම් ආඥාපනත හෝ 1982 අංක 17 දරන සමාගම් පනත හෝ 2007 අංක 07 දරන සමාගම් පනත මගින් පරිච්ඡින්න කරන ලද යම් ලිඛිත නීතියක් අදහස් වේ;

"(6) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ, සංස්ථාගත මණ්ඩලයක, හෝ (6) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ව්‍යාපාර ආයතනයක, හවුල් ව්‍යාපාරයක, භාරයක හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක අර්ථලාභී අයිතියේ හිමිකරුවන්" යන්නෙන් -

(අ) එකී සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා හෝ ලේකම්වරයා වැනි ප්‍රධාන නිලධරයන්;

(ආ) එකී ව්‍යාපාර ආයතනයේ සාමාජිකයන්;

(ඇ) හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන්;

(ඈ) භාරයක් සම්බන්ධයෙන් වන විට දී, (1) වන උපවගන්තියේ නිශ්චිතව

දක්වා ඇති තැනැත්තන්; හෝ

(ඉ) අවස්ථාවෝචිත පරිදි, තත්කාලයේ දී, සංස්ථාගත නොකළ මණ්ඩලයේ සිටින සාමාජිකයන්;

අදහස් වන අතර, එයට එකී සංස්ථාගත මණ්ඩලය, ව්‍යාපාර ආයතනය, හවුල් ව්‍යාපාරය, භාරය හෝ සංස්ථාගත නොකළ මණ්ඩලය සම්බන්ධයෙන් සඵල පාලනයක් පවත්වාගෙන යන්නා වූ වෙනත් යම් ස්වභාවික තැනැත්තකු ඇතුළත් වේ.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19ආ වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19ආ වන වගන්තිය එකී වගන්තියේ (1) (අ) වන උපවගන්තියේ “භාරකරුවකුට සහ සම භාරකරුවකු සිටී නම් එම භාරකරුට” සහ “ඒ භාරකරු විසින්” යන වචන වෙනුවට පිළිවෙලින්, “භාරකරුට හෝ බලයලත් තැනැත්තාට” සහ “ ඒ භාරකරු හෝ බලයලත් තැනැත්තා විසින්” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19ඇ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19ඇ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“5අ වන, 6අ වන, 19 වන, 19අ වන සහ 19ආ වන වගන්ති උල්ලංඝනය කිරීම සඳහා වන දණ්ඩන

**19ඇ.** (1) 5අ වන, 6අ වන, 19 වන, 19අ වන සහ 19ආ වන වගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරන භාරකරුවකු හෝ බලයලත් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන තුනක් නොඉක්මවන දඩයකට

හෝ අවුරුදු දහයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

(2) (අ) භාරකරු සමාගමක් වන අවස්ථාවක, එම සමාගම විසින් 5අ වන, 6අ වන, 19 වන, 19අ වන සහ 19ආ වන වගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරන විට දී එම සමාගම වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන තුනක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දහයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

(ආ) මේ උපවගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන අවස්ථාවක, වරද සිදු කරනු ලබන අවස්ථාවේ දී එකී සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු වූ සෑම තැනැත්තකු විසින් ම, එම වරද එකී තැනැත්තාගේ දැනුමකින් තොරව සිදු වූ බව හෝ එකී වරද සිදු වීම වැළැක්වීම සඳහා එකී තැනැත්තා විසින් සියලු නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, එකී තැනැත්තා විසින් එකී වරද සිදු කරන ලද්දේ යයි සලකනු ලැබිය යුතු ය.

(3) (අ) භාරකරු 5අ වන, 6අ වන, 19 වන, 19අ වන සහ 19ආ වන වගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරන සංස්ථාපිත මණ්ඩලයක්, ව්‍යාපාර ආයතනයක්, හවුල් ව්‍යාපාරයක්, භාරයක් හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක් වන අවස්ථාවක දී, එම සංස්ථාපිත මණ්ඩලය, ව්‍යාපාර ආයතනය, හවුල් ව්‍යාපාරය,

භාරය හෝ සංස්ථාගත නොකළ මණ්ඩලය වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන තුනක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දහයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

(ආ) සංස්ථාපිත මණ්ඩලයක්, ව්‍යාපාර ආයතනයක්, හවුල් ව්‍යාපාරයක්, භාරයක් හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක් විසින් මේ උපවගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන අවස්ථාවක -

(i) එය සංස්ථාපිත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ලේකම්වරයකු;

(ii) එය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම සාමාජිකයකු;

(iii) එය හවුල් ව්‍යාපාරයක් නම්, ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු;

(iv) එය භාරයක් නම්, ඒ භාරයේ සෑම භාරකරුවකු හෝ බලයලත් තැනැත්තකු;

(v) එය ව්‍යාපාර ආයතනයක්, හවුල් ව්‍යාපාරයක් හෝ භාරයක් නොවන සංස්ථාපිත නොකළ මණ්ඩලයක් නම්, එම සංස්ථාපිත නොකළ මණ්ඩලයේ සෑම සාමාජිකයකු,

විසින් ම ඒ වරද සිදු කරන ලද්දේ යැයි සලකනු ලැබිය යුතු අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දහයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය:

එසේ වුව ද, ඒ සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ලේකම්වරයකු ම, ව්‍යාපාර ආයතනයේ සෑම සාමාජිකයකු ම, හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම, භාරයේ සෑම භාරකරුවකු සහ අර්ථලාභියකු ම, එකී සංස්ථාගත නොකළ මණ්ඩලයේ බලයලත් තැනැත්තකු හෝ සෑම සාමාජිකයකු ම, එකී වරද තම දැනුමකින් තොරව සිදු වී ඇති බව හෝ එකී වරද සිදුවීම වැළැක්වීම සඳහා තමා විසින් සියලු නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරන්නේ නම්, ඔහු විසින් එකී වරද සිදු කරන ලද්දේ යැයි සලකනු නොලැබිය යුතු ය.”.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19ඈ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 19ඈ වන සහ 19ඉ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය: -

ප්‍රධාන ප්‍රඥප්තියට 19ඈ වන සහ 19ඉ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම

“රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් දණ්ඩනයක් පැනවීම

**19ඈ.** (1) යම් භාරකරුවකු හෝ බලයලත් තැනැත්තකු, 5අ වන වගන්තියේ (7) වන උපවගන්තියේ, 6අ වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල හෝ 19අ වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කර ඇති බව විශ්වාස කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට ප්‍රමාණවත් සාක්ෂි ඇති අවස්ථාවක, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් උල්ලංඝනය කිරීම සිදු කරන ලද අවස්ථාවේ අවස්ථානුගත කරුණු සැලකිල්ලට

ගෙන, දණ්ඩනයක් පැනවීම උචිත වන්නේ නම්, එකී දැන්වීම ලැබීමේ දින සිට මාසයක් ඇතුළත පෙනී සිටින ලෙස සහ ඔහු වෙත දණ්ඩනයක් පැනවීම සිදු නොකළ යුත්තේ මන්ද යන්නට හේතු දක්වන ලෙස එකී භාරකරුට නියම කරමින්, නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් එකී භාරකරු වෙත දැන්වීමක් භාර දීමට කටයුතු කරනු ලැබිය හැකි ය.

(2) දැන්වීම භාර දෙනු ලැබුවේ කවර භාරකරු හෝ බලයලත් තැනැත්තා වෙත ද, එකී භාරකරු හෝ බලයලත් තැනැත්තා විසින් 5අ වන වගන්තියේ (7) වන උපවගන්තියේ, 6අ වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල හෝ 19අ වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කළ බව එකී දැන්වීම ලැබීමේ දින සිට මාසයක් ඇතුළත පිළිගන්නා අවස්ථාවක, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, භාරකරු හෝ බලයලත් තැනැත්තා මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබුවහොත් 19අ වන වගන්තිය යටතේ පනවනු ලැබිය හැකි උපරිම දඩ මුදලෙන් තුනෙන් එකක් නොඉක්මවන මූල්‍යමය දණ්ඩනයක් එකී භාරකරු හෝ බලයලත් තැනැත්තා වෙත පනවනු ලැබිය යුතු ය.

(3) (අ) දැන්වීම භාර දෙනු ලැබුවේ කවර භාරකරු හෝ බලයලත් තැනැත්තා වෙත ද, එකී භාරකරු හෝ බලයලත් තැනැත්තා එකී දැන්වීම ලැබීමේ දින සිට මාසයක් ඇතුළත පෙනී සිට දණ්ඩනය පැනවීමට එරෙහිවීමට හේතුවක් එකී භාරකරු හෝ බලයලත් තැනැත්තාට ඇති බව ප්‍රකාශ කරන අවස්ථාවක, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කාරණය විභාග කර තීරණය කිරීමට වහාම කටයුතු කරනු ලැබිය හැකි ය.

(ආ) දී ඇති හේතු පිළිබඳව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සෑහීමකට පත් නොවන අවස්ථාවක, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් මේ වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දණ්ඩනය, ඒ සඳහා හේතු දැක්වීමෙන් පසුව, නියම කරනු ලැබිය හැකි ය.

(4) 5අ වන වගන්තියේ (7) වන උපවගන්තියේ, 6අ වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල හෝ 19අ වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් සඳහා මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා යම් භාරකරුවකු හෝ බලයලත් තැනැත්තකු වෙත මූල්‍යමය දණ්ඩනයක් පනවනු ලබන අවස්ථාවක, නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් එකී භාරකරු හෝ බලයලත් තැනැත්තා වෙත එකී තීරණය භාර දෙනු ලැබීමට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කටයුතු කරනු ලැබිය යුතු ය.

(5) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ තීරණය මගින් අතෘප්තියට පත් යම් භාරකරුවකු හෝ බලයලත් තැනැත්තකු විසින්, (3) වන උපවගන්තිය යටතේ කරන ලද එකී තීරණය ලැබීමේ දින සිට දින තිහක් ඇතුළත, (මෙහි මින්මතු "ලේකම්වරයා" වශයෙන් සඳහන් කරනු ලබන) මේ ආඥාපනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.

(6) ලේකම්වරයා විසින්, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ තීරණය සහ වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන, එකී යම් අභියාචනයක් පිළිබඳ තීරණයක් ගනු ලැබිය යුතු අතර -

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ තීරණයට ඉඩදීම, එම තීරණය වෙනස් කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම සිදුකර ඒ අනුව කටයුතු කරන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට විධාන කිරීම හෝ;

(ආ) එහි දක්වනු ලබන හේතු මත අභියාචනයට ඉඩ නොදීම,

යන දෙකෙන් එකක් සිදු කරනු ලැබිය හැකි ය.

(7) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, එකී විධානයෙන් දින දහහතරක් ඇතුළත, ලේකම්වරයා විසින් නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව කටයුතු කළ යුතු අතර ලේකම්වරයාගේ විධානය පිළිබඳව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ තීරණය මගින් අතෘප්තියට පත් භාරකරුට හෝ බලයලත් තැනැත්තාට දැනුම් දිය යුතු ය.

(8) මේ ආඥාපනතේ කුමක් සඳහන් වුව ද, මේ වගන්තිය යටතේ වන සෑම දැන්වීමක් ම භාරකරු හෝ බලයලත් තැනැත්තා වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු හෝ භාරකරුගේ හෝ බලයලත් තැනැත්තාගේ දන්නා අවසාන පදිංචි ස්ථානයේ ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු වන අතර, එලෙස ලියාපදිංචි තැපෑලෙන් යවන ලද්දේ හෝ දන්නා අවසාන පදිංචි ස්ථානයේ ප්‍රදර්ශනය කරන ලද්දේ නම්, එය ඒ භාරකරු හෝ බලයලත් තැනැත්තා වෙත නිසි ලෙස සන්නිවේදනය කරන බවට සලකනු ලැබිය යුතු ය.

(9) මේ ආඥාපනතේ කුමක් සඳහන් වුව ද, භාරකරු හෝ බලයලත් තැනැත්තා විසින් එකී 5අ වන වගන්තියේ (7) වන උපවගන්තියේ, 6අ වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති

හෝ 19අ වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් වරද සිදු කරන ලද බව පිළිගෙන එකී දඩ මුදල් ගෙවා ඇති අවස්ථාවක, එකී වරද සම්බන්ධයෙන් ම කිසිදු අධිකරණයක කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(10) (අ) ලේකම්වරයාගේ තීරණය මගින් අතෘප්තියට පත් යම් භාරකරුවකු හෝ බලයලත් තැනැත්තකු විසින්, එකී තීරණය සන්නිවේදනය කරනු ලැබුවේ යැයි සලකනු ලබන දින සිට දින තිහක් ඇතුළත, නීතිමය ගැටලුවකට එරෙහිව, අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) මේ උපවගන්තිය යටතේ වන අභියාචන සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදන තුරු, ඒ ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණය වෙත කරන ප්‍රතිශෝධන ඉල්ලීමක් සම්බන්ධයෙන් සාදන ලද රීති, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම අභියාචනාවක් ම සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතු ය.

දණ්ඩනය අය කර ගැනීම

**19ඉ.** (1) 19ඈ වන වගන්තියේ (4) වන හෝ (7) වන උපවගන්ති යටතේ කරනු ලබන තීරණයෙන් මාසයකට පසුව, එකී තීරණය කරනු ලැබුවේ කවර භාරකරු හෝ බලයලත් තැනැත්තා සම්බන්ධයෙන් ද, එකී භාරකරු හෝ බලයලත් තැනැත්තා විසින් දණ්ඩනය ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, එකී තැනැත්තා වෙත බාර දුන් දැන්වීමේ සහ තීරණයේ සහතික කළ පිටපතක් එකී උල්ලංඝනය කිරීම සිදු වූ කොට්ඨාසය සඳහා අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු වෙත නිකුත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් සාක්ෂි ලෙස යොදාගනු ලැබිය යුතු අතර එහි සඳහන් කරුණු බැලූ බැල්මට පිළිගත යුතු සාක්ෂියක් විය යුතු ය.

(3) මහෙස්ත්‍රාත්වරයා විසින් ඉන්පසු, (1) වන උපවගන්තිය යටතේ දඩය ගෙවීම පැහැර හැර ඇති එකී භාරකරු හෝ බලයලත් තැනැත්තා ඔහු ඉදිරියට කැඳවිය යුතු අතර 19ඇ වන වගන්තිය යටතේ ගෙවිය යුතු මුදල ලබා ගැනීම සඳහා භාරකරු හෝ බලයලත් තැනැත්තා සම්බන්ධයෙන් නීති කටයුතු ඉදිරියට ගෙන නොයැමට හේතු දක්වන ලෙසට එකී භාරකරු හෝ බලයලත් තැනැත්තාට දන්වනු ලැබිය යුතු අතර ප්‍රමාණවත් කරුණු හේතු ලෙස නොදක්වන විට දී, ඉන් අනතුරුව, එකී මුදල සිරගත කිරීමකින් දඬුවම් කළ යුතු වරදකට ඒ තැනැත්තාට මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලැබූ දඩයක් ලෙස සලකනු ලැබිය යුතු ය. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 291 වන වගන්තියේ විධිවිධාන අනුව (එහි (1) වන උපවගන්තියේ (අ) වන, (ඇ) වන සහ (එ) වන පරිච්ඡේද හැර) ගෙවීම් පැහැර හැරීමකට අදාළව එකී වරදකට නියම වන දඩයක් එවිට අදාළ විය යුතු අතර එකී දණ්ඩනය නියම කරන අවස්ථාවේ දී ඒ උපවගන්තියේ විධිවිධාන අනුව මහෙස්ත්‍රාත්වරයා විසින් යම් කරනු ලැබිය හැකිව තිබුණා වූ විධානයක් මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකි ය.”.

**10.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව